(114)

වගා දිරි දීමනා චක්‍රලේඛ අංක - 51

අපේ අංකය : සං/දිරි දීමනා/
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
අංක. 70, පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
1998.09. 29 දින.

සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන්,
සහකාර ප්‍රාදේශීය කළමනාකරු (කෑගල්ල/මතුගම)

**පාලු සැපයීමේ දිරි දීමනා ගෙවීම් ක්‍රමය යටතේ තේ ඉඩම් සංවර්ධනය කිරීම වෙනුවෙන්**
**<u>සමිති වලින් ලැබෙන ඉල්ලුම් පත්‍ර සඳහා අනුගමනය කළයුතු ක්‍රියා පිළිවෙත.</u>**

**චක්‍රලේඛයේ පරමාර්ථ**

| | |
|---|---|
| 1. | **පාලු සැපයීමේ දිරිදීමනා ගෙවීම් ක්‍රමය යටතේ, දිරි දීමනාව පැලයකට රු. 7.50 දක්වා වැඩි කිරීම තුලින් පාලු පැල සපයා වඩාත් සාර්ථකව හා නිවැරදිව ඉඩම් සංවර්ධනය කිරීමට පෙළඹවීමක් ඇති කිරීම.** |
| 2. | **පාලු සැපයීමට සුදුසු ඉඩම් ඒ සඳහා යොමුකර ගැනීම තුලින් කුඩා තේ වතු අංශයේ එලදාව අඩුවීමෙන් වලකාලීම.** |

පාලු සැපයීම සඳහා අවසර දීමේදී හා ගෙවීම් කිරීමේදී පහත සඳහන් පරිදි ක්‍රියාත්මක විය යුතුය.

**ඉල්ලුම් පත්‍ර භාරගැනීම :-**

ඊසානදිග මෝසම් කලාප සඳහා අප්‍රේල් 30 දිනට ප්‍රථම සහ නිරිත දිග මෝසම් කලාප සඳහා දෙසැම්බර් 31 දිනට ප්‍රථම ඉල්ලුම් පත්‍ර භාරගත යුතුය.

**ඉල්ලුම් පත්‍ර ලබාගැනීමේ පිළිවෙල හා**
**පරීක්ෂණ පැවැත්වීම :-**

සාමාජික ඉඩම් වල පාළු සැපයීමට අපේක්ෂා කරන සමිතියක් ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කිරීමට ප්‍රථම තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරී වෙත , අධීක්ෂණ තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරී වෙත හෝ ප්‍රාදේශීය කළමනාකරු වෙත දැනුම්දීම හෝ මෙහෙයුම්කරුවන්ගේ ක්‍රියාවලිය තුලින් තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන්ගේ තෝරාගැනීම මත මේ සඳහා ඉල්ලුම් කළ හැකිය. පාළු සැපයීම සඳහා ඉදිරිපත් වන ඉඩම්වල ඒ සඳහා වූ යෝග්‍යතාවය පිළිබඳව ඉඩම් හිමියා සහ සමිතිය දැනුවත් කර ඒ අනුව ඒ අනුව ඉල්ලුම් කළ හැකිවනු පිණිස ඉහත පරිදි දැනුම්දීමක් කළ විගස තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරී විසින් ඒ පිළිබඳ පුහුණු සැසියක් පැවැත්විය යුතු අතර, එහිදී පහත සඳහන් කරුණු ඇතුළුව මේ පිළිබඳ පූර්ණ අවබෝධයක් ලැබෙන සේ මෙම ක්‍රමය පැහැදිලි කර දිය යුතුය.

1. 1999 වර්ෂයේ සිට තෘණ වගා කිරීමෙන් පස සාරවත් කිරීමේ ක්‍රමය පමණක් ක්‍රියාත්මක වන බැවින් ඉල්ලුම් පත්‍ර ලබාගන්නා වසරේ සිට වසර 2 ක් ඇතුලත කප්පාදුව එළඹෙන ඉඩම් සඳහා පමණක් ඉල්ලුම් කරන ලෙස එහිදී දැනුවත් කළ යුතු අතර, එම අවස්ථාවේදීම අදාල සාමාජික ඉල්ලුම් පත්‍ර සමිතිය වෙත ලබාගත යුතුය. එම ඉල්ලුම් පත්‍ර සමිතිය සහ තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීගේ අත්සන යොදා ලැයිස්තුගත කර, සමිතිය මගින් මූලික පරීක්ෂණය පවත්වා නිර්දේශ කර එවීමට සමිතිය වෙත භාර දිය යුතුය.

**2. ඉඩම් තේරීම :-**

තේ පැල සිටුවීමෙන් පසුව පළමු කප්පාදුව ( මට්ටම් කැපීම නොවේ) අවසන්ව තිබිය යුතු අතර, දෙවන කප්පාදුවේ සිට ඉදිරියට ඇති කප්පාදු අවස්ථාවලදී පාළු සැපයීමට පුළුවන. තවද, ඉදිරි වසර10 ක් හෝ ඊට වැඩි කාලයක් සාර්ථක අස්වැන්නක් ලබාගත හැකි රිකිලි/ බීජ තේ ඉඩම් පාලු දිරිදීමනා ක්‍රමය යටතේ සංවර්ධනය කිරීම සඳහා සලකා බැලිය හැකිය.

**3. පස සාරවත් කිරීම :-**

පාලු සපයා සංවර්ධනය කිරීමට යෝජිත කොටස්වල පස සාරවත් කිරීම සඳහා අනුමත තෘණ වගාකර වසර 1 1/2 කාලයක් නඩත්තු කිරීම අවශ්‍ය වේ. තෘණ නඩත්තු කරන අවම කාලය තුලදී තෘණ සිටුවා මාස 06 කට පසුව හා වසර 1 1/2 සම්පූර්ණ වූ පසු එම ඉඩම් පිළිබඳව ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තාවක් සමිතිය මගින් ලබාගෙන පාලු සැපයීමේ ගොනුවට ඇතුලත් කළ යුතුය. මෙම පරීක්ෂණ වාර්තාව අනුව තේ පරීක්ෂක/ ව්‍යාප්ති නිලධාරි විසින් නියැදි පරීක්ෂණයක් කර වාර්තා කළයුතු අතර, එම අවස්ථා දෙක සඳහාම හරස් පරීක්ෂණයක් පැවැත්වීමට ප්‍රාදේශීය කළමනාකරු විසින් කටයුතු කළයුතුය.

1998 වසරේ හා දැනටමත් ඉදිරිපත් කර ඇති ඉල්ලුම් පත්‍ර යටතේ 1999 වසරේ පාලු සැපයීමට යෝජිත ඉඩම්වල පමණක් පස සාරවත් කිරීම සඳහා විකල්පයක් ලෙස කොම්පෝස්ට් යොදා පාලු සපයා ගැනීමට අවසර දෙනු ලැබේ. එහෙත් එම ඉඩම්ද ඉහත අධීක්ෂණයට යටත්විය යුතුය.

**4. පාළු සිටුවීම සඳහා අවශ්‍ය තේ පැල සකස්කර ගැනීම :-**

තෘණ සිටුවා මාස06 කට පසු පරීක්ෂණ අවස්ථාවේදී තේ පැල සකස්කර ගැනීම පිළිබඳ වාර්තා සමිතිය හා තේ පරීක්ෂක/ ව්‍යාප්ති නිලධාරි විසින් ප්‍රාදේශීය කළමනාකරු වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම වාර්තාව පදනම් කොට තවාන් සැකසීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය නියමිත දිරි දීමනා මුදලින් අධිකාරිය මගින් මිළට ගෙන සැපයීමට පුළුවන. එම තවාන් සමිතියේ අධීක්ෂණය යටතේ තවාන් ඇති කිරීමට යෝග්‍ය සාමාජික ඉඩම් එකක හෝ කීපයක ඇතිකළ හැකිය. අධිකාරියේ ලියාපදිංචිව ඇති යම් වාණිජ තවානක් සමග සමිතිය මගින් ගිවිසුමක් ඇති කරගෙන ඉදිරිපත් කළහොත් එම තවානට ගෙවීම් කිරීම පිළිබඳ සලකා බැලීමට පුළුවන. කිසිදු අවස්ථාවක සමිතියට හෝ සාමාජිකයන්ට අත්තිකාරම් වශයෙන් මුදලින් ගෙවීම් නොකළ යුතුය.

**5. කප්පාදු කිරීම :-**

පාලු දිරි දීමනා ක්‍රමය යටතේ පාලු සපයන ලද ඉඩම්, පස සාරවත් කිරීමෙන් අනතුරුව පාළු සිටුවන අවස්ථාවේදී, පාළු පැල සිටුවීමට ප්‍රථම කප්පාදු කර තිබීම අනිවාර්ය වේ. ගෙවීම් පරීක්ෂණ අවස්ථාවේදී කප්පාදු නොකර පාලු සපයා ඇති ඉඩම් වලට ගෙවීම් නිර්දේශ නොකල යුතුය.

**6. බිම සීමාවන්, ලබාදිය හැකි පැල සංඛ්‍යාව හා දිරි දීමනාව :-**

ඉඩමේ බිම් ප්‍රමාණය කොතෙක් වුවද වරකට අක්කර 01 ක බිම් ප්‍රමාණයක් පාලු සැපයීමට අදාල දිරි දීමනා ක්‍රමය යටතේ ඉල්ලුම් කළ හැකිය.

මහනුවර, මාතලේ, නුවරඑළිය, බදුල්ල දිස්ත්‍රික්ක සහ රත්නපුර දිස්ත්‍රික්කයේ ඊසානදිග වගා කන්නයට අදාල බලංගොඩ ප්‍රදේශය සඳහා ( හෙක් / පැල 2470) අක්කරයකට පැල 1000 ක් සහ අනෙකුත් සියලුම තේ වගා ප්‍රදේශ සඳහා අක්කරයකට පැල 750 ( හෙක් / පැල 1850) ක උපරිම ප්‍රමාණයක් දක්වා දිරි දීමනා ගෙවනු ලැබේ.

පාලු සැපයීම සඳහා ගෙවනු ලබන දීරි දීමනාව පැලයකට රු. 4.00 සිට 7.50 දක්වා 1998.08.06 දිනැති අංක 50 දරන වගා දීරි දීමනා චක්‍රලේඛය පරිදි දැනටමත් වැඩිකර ඇත. ඒ අනුව පැල සිටුවීම හා නඩත්තු කිරීම සඳහා පිළිවෙලින් පැලයකට රු. 5/- ක් හා රු. 2/50 ක් හිමිවනු ඇත.

ඉහත සඳහන් කර ඇති කරුණු පිළිබඳව තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරි විසින් සමිතිය සහ ඉල්ලුම්කරුවන් හමුවන ප්‍රථම අවස්ථාවේදීම ඔවුන් දැනුවත් කිරීම කළයුතුය.

පාළු සැපයීම සඳහා වූ සමිතියේ ඉල්ලුම්පත අධිකාරිය අනුමත කළ පසුව, තේ පැල සපයා ගැනීම සඳහා අත්තිකාරම් ලෙස ද්‍රව්‍යාධාර ලබාගැනීම හෝ තේ පැල සඳහා වාණිජ තවානකට ගෙවීමක් අවශ්‍ය වන්නේ නම් ඒ පිළිබඳව ප්‍රාදේශීය කළමනාකරු වෙත ඉල්ලීමක් කළ පසුව විධිමත් ගිවිසුමකට අනුව එය ක්‍රියාත්මක කළහැකිය. එසේ සපයනු ලබන ද්‍රව්‍යාධාර වල වටිනාකම එක් එක් වාරිකය යටතේ හිමිවන මුදලින් පියවා ගැනීමට කටයුතු කළ යුතුය.

පාලු සැපයීමේ ක්‍රමයට අදාලව නිකුත් කරන ලද වගා ආධාර චක්‍රලේඛ 46 පරිදි නියමිත ගිවිසුම් හා ආකෘති 1,2,3 මේ සඳහාද එම අයුරින්ම භාවිතා කළහැකි අතර. පරීක්ෂණ පැවැත්වීමේ ක්‍රමයද නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය.

මෙම චක්‍රලේඛය ලද බවත්, ඒ අනුව ක්‍රියාකරන බවත් නොපමාව මා වෙත දැන්විය යුතුය.

(රෝහණ ඉලංගරත්න)
සභාපති.

පිටපත් :-

1. සාමාන්‍යාධිකාරී
2. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාප්ති/සංවර්ධන) )
3. සහකාර සාමාන්‍යාධිකාරී (ක්‍රමවේද/අධීක්ෂණ) )
4. සහකාර සාමාන්‍යාධිකාරී (මෙහෙයුම් හා සේවා) )
5. සහකාර සාමාන්‍යාධිකාරී (පරිපාලන) )
6. අභ්‍යන්තර විගණක ) දැනගැනීම හා
7. මුදල් කළමනාකරු ) අවශ්‍ය කටයුතු සඳහා
8. කෘෂි අර්ථශාස්ත්‍රඥ )
9. සියලුමසහකාර ප්‍රාදේශීය කළමනාකරුවන් (ව්‍යාප්ති) )
10. සියලුම ප්‍රාදේශීය ක්ෂේත්‍ර නිලධාරීන් )
11. සියලුම මාණ්ඩලික නිලධාරීන් )
12. අධීක්ෂක තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන් )
13. තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන් )
14. ලේකම් - සමස්ත ලංකා කුඩා තේ වතු සමිති සංවිධානය
15. ලේකම් - කුඩා තේ වතු සංවර්ධන සමිතිවල සියලුම ප්‍රාදේශීය සංවිධාන

C/PM5/AV-INS